සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

32864

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II

කාලය / நேரம் / Time: පැය 3 යි

නම / பெயர் / Name ..............................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.
අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා, තේරුම් ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

---

උපදෙස්
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

★ අංක 1 සිට 4 තෙක් ඇති ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ <u>තද කළු අකුරින් මුද්‍රිත</u> කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. කෘතහස්ත ලේඛකයාගේ ඒ කාව්‍ය සංග්‍රහය <u>උණු කැවුම් වගේ</u> අලෙවි වූ බව පාඨකයෝ දනිති.
(1) ඉතා ඉක්මනින් (2) ඉතා රසවත් සේ
(3) සාමාන්‍ය පරිද්දෙන් (4) කැවුම් සේ ඉතා රසවත් ව

02. පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් තමාට <u>හතේ හත වැදිලා</u> යැ'යි ඇතැම් මහා පරිමාණ ව්‍යාපාරිකයෝ පැවසූහ.
(1) විශාල වශයෙන් ලාභ ලැබී (2) ඉතා අසිරුතාවට පත් වී
(3) විශාල වශයෙන් පරිහානියට පත් වී (4) ඉතා වාසි සහගත වී

03. ඒ සේවකයා ඉතා සැහැල්ලුවෙන් තම <u>ඇඟ බේරා ගත්තේ</u> යැ'යි සෙසු සේවකයෝ කියා සිටියහ.
(1) කරදරයකින් ගැලවී (2) වගකීමෙන් නිදහස් වී
(3) කළ යුතු යුතුකම ඉටු නො කළේ (4) අනතුරකින් ආරක්ෂා වී

04. ඇතැම් ව්‍යාපාරිකයින් <u>ගජබින්නාලංකාර</u> දේශනා කරන බව ඕනෑ ම අයකු දන්නා කරුණකි.
(1) විශාල බොරු විස්තර (2) ඉතා දීර්ඝ විස්තර
(3) තමා කළ කටයුතුවල පුරාජේරු (4) කිරීමට යන වැඩ පිළිබඳ

★ අංක 5 සිට 8 තෙක් ඇති ප්‍රශ්නවලට වඩාත් සුදුසු පදය තෝරන්න.

05. සිංහබාහු නාට්‍යය නැරඹූ .......................... එය ඉතා හොඳින් රස විඳි බව ප්‍රකාශ කළෝ ය.
(1) ශ්‍රාවකයෝ (2) පාඨකයෝ
(3) දේශකයෝ (4) ප්‍රේක්ෂකයෝ

06. අධික වර්ෂාව නිසා වගාවන්ට සිදු වන හානිය පිළිබඳ ගොවීහු තම...................... ඉදිරිපත් කරති.
(1) කෙණෙහිලි (2) මැසිවිලි
(3) ඇවිටිලි (4) විමසිලි

07. නිර්මාණකරණයේ දී අකුරු, පද පුන පුනා යෙදීම .................. නමින් හඳුන්වයි.
(1) අනුප්‍රාසය (2) උත්ප්‍රාසය
(3) උත්ප්‍රේක්ෂාලංකාරය (4) ව්‍යංග්‍යාර්ථය

08. 'මුහුණේ ඉරියව් මගින් අදහස් ප්‍රකාශනය කිරීම ද නාට්‍යයක දී සිදු වේ' එය.................... නමින් හඳුන්වයි.

(1) ආංගිකාභිනය
(2) වාචිකාභිනය
(3) ආහාර්යාභිනය
(4) සාත්විකාභිනය

09. අඳුන්කුලක්, අමාතය, පෝරුවක්, කෝවේයකට යන පදවල දෙවැනි අකුරෙහි ඇති ස්වරය නියෝජනය වන පිල්ලම පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ගයනුකිත්ත, පාපිල්ල, කෙටි ඇදය, කොම්බුව හා දීර්ඝත්ව ලකුණ
(2) කෙටි පාපිල්ල, ගැට ඇලපිල්ල, කෙටි පාපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලකුණ
(3) ඇදපිල්ල, රකාරාංශය, පාපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලකුණ
(4) කෙටි පාපිල්ල, ගැට ඇලපිල්ල, ඇදපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලකුණ

10. නිවැරදි ලෙස පද විසන්ධි කර ඇති වරණය තෝරන්න.

(1) වලු+ මුතු, දරු+ඕ, පස්+සාලිස්, රිය+එන්
(2) දෙ+ ඇඟිලි, සිහ+සුන, සිත්+ වරු, පුන+ උත්පත්ති
(3) නළු+ඕ, නම්+පලා, ඇද්+ දළ, බළල්+හු
(4) ගහ+තෙර, දකුණු+අත, සිහින්+ ඉහ, ධර්මා+වබෝධය

11. උක්ත නාම පද දෙකක් හා අනුක්ත නාම පද දෙකක් පිළිවෙළින් යෙදී ඇති වරණය වන්නේ,

(1) ගවයෝ, ශිෂ්‍යයන්, දරුවන්, ගායිකාවක
(2) ගායකයෝ, විනිශ්වයකරුවෝ, මෙහෙණියක්, වැදිරියක
(3) ගුරුවරු, ක්‍රීඩකයෝ, විනිසුරුවරුන්, සොල්දාදුවන්
(4) කුරුල්ලෝ, වලස්සු, ගොන්නු, සිංහයන්

12. අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද සහිත වරණය තෝරන්න.

(1) කාවෙ‍්‍යාක්ති, වාච්‍යාර්ථ, ප්‍රහර්ශය,විස්මයෝත්පුල්ල
(2) ගාම්භිරත්වය,ධ්වනිපුර්ණ, අවස්ථාවෝචිත, හසලත්වය
(3) ප්‍රබන්ධකතා, හේතුපලසම්බන්ධය, සතථාභ්‍යාසය, පරිශීලනය
(4) පිළියෙල, සිද්ධස්ථාන, වාලුකාංගණ, පුජ්ජාධාන

13. මුලින් දි ඇති අක්ෂර වර්ගයට අයත් නොවන අක්ෂරයක් සහිත වරණය තෝරන්න

(1) අඝෝෂ, අල්පප්‍රාණ - ක,ච,ට,ත,ප
(2) ඝෝෂ මහාප්‍රාණක්ෂර - ඝ,ඣ,ඪ,ධ,භ
(3) නාසික්‍ය අක්ෂර - ඞ , ඤ, ණ, න, ස
(4) ඕෂ්ඨජාක්ෂර - ප, ඵ, බ, භ, ම

★ අංක 14 සිට 17 දක්වා ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

14. " එතෙපුල් අමාහැල්ලෙන් <u>**කෝ ගිනිකඳ**</u> නිවී ගිය".

(1) කෝපය නමැති ගිනි කඳ
(2) විශාල ගිනි කන්ද
(3) කන්දක් වැනි ගින්නක්
(4) ගිනි කඳක් වැනි කෝපය

15. "<u>**සිව් සඟරාවතින්**</u> දසරජ දමින් බැඳී"

(1) සඟරා හතරකින්
(2) වර්ණ හතරකින්
(3) සතර මහා නිධානය
(4) සතර සංග්‍රහ වස්තු

16. "සාර්ථක කෙටිකතාවක් නිර්මාණය කිරීම <u>**ආකස්මික ව**</u> කළ හැකි දෙයක් නො වේ."

(1) නිරන්තර ව
(2) හේතුවක් නැති ව
(3) අරමුණින් තොර ව
(4) අනුමානයක් නැති ව

17. "හෙ බුදුන්ගෙ බස් අසා, ඇස් විවර කොටැ බුදුන්ගේ රුසිරි බලා, <u>**පිළිලද සංවේග**</u> ඇති වූයෙ."

(1) දුකක්
(2) දැඩි සන්තෝෂයක්
(3) අවබෝධයෙන් යුක්ත ව
(4) අධික වේදනාවක්

18. තද්ධිත පදයක් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) හරවු, බීමත්, ඉසුරුමත්
(2) විශාලතම, විශේෂඥ, ශෛලමය
(3) සිරිමත්, ස්නේහවන්ත, නැවියා
(4) මැණි, දේශීය, ඉන්දියානු

19. 'ගය' ක්‍රියා මූලයෙන් සකස් වන අතීත කාල කර්මකාරක බහුවචන පදය කුමක් ද?
(1) ගැයුහ (2) ගැයුවේ ය
(3) ගයන ලදි (4) ගයනු ලැබූහ

20. "කියත උන් මෙතෙපල - ආයේය ඇදුරු ගුත්තිල" යෙදුමේ 'කියත' යන පදය.
(1) අවසාන ක්‍රියා පදයකි. (2) ද්‍රව්‍ය නාම පදයකි.
(3) අතීත කාල ක්‍රියා පදයකි. (4) අසම්භාව්‍ය ක්‍රියා පදයකි.

21. මුලින් දී ඇති ක්‍රියා වර්ගයට නොගැළපෙන ක්‍රියා පදය සහිත වරණය තෝරන්න.
(1) මිශ්‍ර ක්‍රියා - නටමින්, ගයමින්, රහ රහා, කියමිනි
(2) අසම්භාව්‍ය ක්‍රියා - කරද්දී, නැවුවොත්, බැලුවහොත්, නටත්
(3) පූර්ව ක්‍රියා - නටා, කා, සකසා, පා
(4) විධි ක්‍රියා - බල, බොව, රහනු, පලයං

22. මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන පදය සහිත වරණය තෝරන්න.
(1) ලෝකය - දිය, භුවන, ලෝ, ලෙව්
(2) වැද්දා - නේසාද, පුළිඳු, වනදන, සබර
(3) මොනරා - පිල්බර, මයුර, සිකි, හස්
(4) රන් - කනක, කසුන්, ස්වර්ණ, හේම

23. මුලින් දී ඇති බහ්වර්ථ පදයට නොගැළපෙන අර්ථ සහිත පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) දිය - ජලය, ජය, ලෝකය, දූපත
(2) තුරු - වෘක්ෂය,තූර්ය, තෙක් ,තරු
(3) කර - උර,බෙල්ල, රශ්මිය, ඇළිපිහිය
(4) අඹ - ජලය, කාන්තාව, පලතුර, වලාකුළ

24. නිවැරදි ලෙස විරාම ලක්ෂණ යෙදුණු උද්ධෘතය තෝරන්න.
(1) හැබැට! ෂ: මට වැරදිලා! හම් දැන් නම් ඉතින් කරන්න දෙයක් නෑ?
(2) "සර්ලා ළඟදි නේද? මේ ගෙදරට ආවේ.ඔහු ඇසී ය."
(3) "මොකක් ? ඔළුව නරක් වෙගෙන එනවා වගේ" ඇයට කියැවිණි.
(4) "ගොන් බඳින කණුවක්?" යි කියමින් ඔවුහු සිනාසුණහ

25. මොනරාගල ප්‍රදේශය ආශ්‍රිත භාෂාවේ ඉඟුරු, අඹ ,කොකිස්, පුහුල් යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) ඉරිඟු, වට්ටක්කා ,ගස්ලබු, කිරි අල
(2) වට්ටක්කා, ගස්ලබු, කිරි අල, ඉරිඟු
(3) ඉරිඟු, ගස්ලබු ,වට්ටක්කා, කිරි අල
(4) ඉරිඟු, ගස්ලබු, කිරි අල, වට්ටක්කා

**★ 26 සිට 28 තෙක් වාක්‍යවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

26. (1) ඔවුහු නීතිගරුක පුරවැසියෝ වූහ.
(2) ඒ තෙමේ විභාගය හොඳින් සමත් වූවා ය.
(3) මම දක්ෂ ක්‍රීඩකයෙකු වන්නේ කෙසේ ද?
(4) ඇතැම් ශිෂ්‍යයෝ පාඩම් වැඩ අත් හරිනු ඇත.

27. (1) දරුවන් සෙල්ලම් කරති' යි ගුරුවරුන් සිතුහ.
(2) ඔවුන් පැමිණිය හොත් අපි හොඳින් පිළිගනිමු.
(3) පයින් ගමන් කරන්නන් දකුණුපසින් යා යුත්තාහ.
(4) මම ඉතා හොඳින් වැඩ කළ යුතු ය.

28. (1) මිනිස්සු රට ගැන සිතා කටයුතු කරන්නේ කවදා ද?
(2) ඔවුහු මා සමඟ එක් ව බොහෝ කාලයක් වැඩ කළේ ය.
(3) අම්මා නොහොත් තාත්තා අප වෙනුවෙන් වෙහෙසුණේ ය.
(4) ගොවියෝ විසින් ගොනුන් බැඳෙති.

29. පහත 'අ' කොටස සමග 'ආ' කොටස ගැළපීමේ දී අනුපිළිවෙළින් නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

| අ | ආ |
|---|---|
| A දුන්න දුනුගමුවේ | E සෝමලතා සුබසිංහ |
| B ගුරු තරුව | F සුගතපාල ද සිල්වා |
| C දෝන කතරිනා | G ජයලත් මනෝරත්න |
| D පුංචි අපට දැන් තේරෙයි | H කේ. බී. හේරත් |

(1) EGFH (2) FEGH
(3) GHEF (4) FGHE

30. පහත සඳහන් කවියේ හිස්තැනට සුදුසු පදය තෝරා ලියන්න.

ඇති මුත් මිණි මුතු අබරණ
දිනූ මුත් සම්පත් අපමණ
......................................
රුදු වග වලසුන් විලසේ

(1) අඳුරට බිය වෙයන් පුතේ (2) උඹ මිනිහෙක් වෙයන් පුතේ
(3) හිරු එළියට බිය නොම වී (4) වුවහොත් රජ නපුරු වෙතේ

★ 31 සිට 33 දක්වා ප්‍රශ්නවල එක් එක් ප්‍රස්තාව පිරුළට වඩාත් ගැළපෙන ප්‍රකාශය කුමක්දැ'යි තෝරන්න.

31. " නාකි වුණා ම යකත් තපස් රකියි ලු"
(1) වෙස් වළාගෙන සිටියත් පසු ව නියම ස්වභාවය පෙන්වීම
(2) මහලු වියට පත් වූ කල්හි කවුරුත් හොඳ දේ කිරීමට සූදානම් වෙති
(3) සැදෑ සමයේ මහන්සිය නිසා විශ්‍රාම සුවයෙන් සිටීම
(4) බැඳීම් හා සම්බන්ධතාවලින් වෙන් ව කටයුතු කිරීම

32. "ගහ වැටෙන කොට හෙවණැල්ලත් නැති වෙනව ලු"
(1) ගස වැටීමත් සමඟ එහි හෙවණැල්ල නො පෙනී යයි.
(2) සහජයෙන් ම ඇති වන දේවල් විනාශයට පත් වෙයි.
(3) අධිපතියකු, ප්‍රබලයකු නැති වූ කල්හි ඔහු ඇසුරේ සිටියවුන්ට ද ඔහුගේ වියෝව බලපාන බව
(4) උසස් පහත් භේදයකින් තොර ව කාටත් ස්වභාව ධර්මයේ බලපෑම සිදු වෙයි.

33. "කැස්බෑවාගෙත් කිකිළිගෙත් බිජු දැමිල්ල වගේ"
(1) විශාල කාර්යයක් කර නිහඬ ව සිටීමත් ඉතා කුඩා වැඩක් කර දැඩි ඝෝෂාවක් කරන බවත් ප්‍රකාශ වේ.
(2) කරට කර දෙදෙනකුගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව පැවසේ.
(3) ස්ථාන දෙකක දෙදෙනෙකුගේ හැසිරීම විවිධ වේ.
(4) උතුම් කෙනෙකුගේ හා පහත් කෙනෙකුගේ ක්‍රියාකාරකම් පිළිබඳ පැවසේ.

34. උපසර්ග පදයක් යෙදී නැති වරණය තෝරන්න.
(1) ප්‍රබන්ධ, නිර්මල, සපිරි, අවගුණ
(2) ප්‍රත්‍යුපකාර, පිළිවෙත, අධිපති, දුගුණ
(3) දුර්ගුණ, ඉමහත්, කුකවි, විමුක්ත
(4) ඉබොහෝ, අවමඟුල්, දෙමාපිය, දුසිරිත්

35. අක්ෂර ගැළපීමෙන් සුපතළ ලේඛකයකුගේ නම නිවැරදි ව සූචනය වන අක්ෂර සහිත වරණය තෝරන්න.
(1) විසිපිජේයලින්මානය (2) ධරජිර්තිකින්ත්මර්න
(3) දනගුසේයාණංසිහ (4) ටිවිර්මාන්ක්‍රසිමහංය

36. පහත සඳහන් ප්‍රකාශය ලිඛිත ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි ව අර්ථ ප්‍රකාශ වන වාක්‍යය තෝරන්න.
"අපි හොඳට විභාගෙ ලියාවි කියලා ගුරුවරු හිතාගෙන ඉන්නවා"
(1) අපි හොඳින් විභාගය ලියමු' යි ගුරුවරු සිතූහ.
(2) අප හොඳින් විභාගය ලියමු' යි ගුරුවරු සිතති.
(3) අප හොඳින් විභාගය ලියති'යි ගුරුවරු සිතති.
(4) අපි හොඳින් විභාගය ලියති'යි ගුරුවරුන් සිතති.

37. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය කුමක්දැ'යි තෝරන්න.

(1) 'ලය්සන ම අහස හා මතක යිතිවිලි' කෘතිය රත්න ශ්‍රී විජේසිංහ මහතාගේ කෘතියකි.
(2) 'නිර්මාණ පසුබිම' නම් කෘතිය මහගමසේකර සූරීන්ගේ නිර්මාණයකි.
(3) ඩබ්.ඒ. සිල්වා මහතාගේ නිර්මාණයක් ලෙස 'සක්වාලිහිණි' නම් කළ හැකි ය.
(4) 'විජයබා කොල්ලය' ඒ. වී. සුරවීර මහතාගේ කෘතියකි.

32879

38. ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ කලගෝට්ටි, කලගෝලිච්චා යන පද සඳහා ලබා දී ඇති ව්‍යවහාර පදය වන්නේ,

(1) කලබලය (2) වෙහෙසීම
(3) කරච්චලය (4) කලකිරීම

39. පහත සඳහන් කවියේ අර්ථය නිරවුල් ව ප්‍රකාශ වන වරණය තෝරන්න.

දවස පුරා දිව වහළේ'වි උදය වරා
අවර 'ඔරා පත් වර තරඟ තින් දරා
සරත දුරා කැරැ නහවනුව සමුදුරා
සහස කරා කර ඇදි වැන්නැ තම කරා

(1) සූර්යයා බටහිර අහසට පිවිස එහි සිටින විට සමුද්‍රය තම තරංගවලින් සූර්යයා ඔසවා දිය නාවනු පිණිස තමා වෙත ගෙන්වා ගත්තා වැනි ය.
(2) දවස පුරා වෙහෙසුණු හිරු බටහිර අහසට පිවිසුණ විට, සමුද්‍රය තම තරංග නමැති අතින් උසුලාගෙන සූර්යයාගේ වෙහෙස දුරු කර දිය නාවනු සඳහා රශ්මිය නැමැති අතින් තමන් කරා ඇදගත්තා වැනි ය.
(3) සූර්යයා දිනය පුරා වෙහෙසී බටහිර අහසට පිවිසෙයි. සමුද්‍රය ද තම තරංග හකුළාගෙන නින්දට වැටෙයි. නැවත පසුදින සූර්යයා නැගෙනහිරින් පැමිණෙයි. සමුද්‍රය ද සූර්යයා කරා ඇදී එන්නා සේ උදාසන ම රළ තරංග නංවයි.
(4) දවස ගෙවී යයි. සූර්යයා ද තම සේවාව නිම කර රළ තරංග තුළ සැඟවී යයි. සමුද්‍රයේ රළ තරංගවලින් ස්නානය කරන සේ එය දර්ශනය වේ. බස්නාහිර අහසේ මෙම දර්ශනය දැක ගත හැකි ය.

40. ශ්‍රී ලංකාවට ගැළපෙන ඖෂධ ප්‍රතිපත්තියක් පිළිබඳ ප්‍රධාන යෝජනා 5ක් ඇතුළත් ලියවිල්ල ඉදිරිපත් කළ, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා ද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මුල් ම පීඨාධිපතිවරයා ද වූ අසහාය පුද්ගලයා වනුයේ,

(1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
(2) මහාචාර්ය සේනක බිබිලේ මහතා
(3) මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා
(4) මහාචාර්ය වල්පොල රාහුල හිමි

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය - II

නම / பெயர் / Name ..............................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

1. (i) සිට (x) දක්වා ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල වර්ණමාලාවේ ඇතුළත්,
(අ) 'කණ්ඨජ' වර්ගයට අයත් ස්වර දෙකක්
(ආ) 'ඕෂ්ඨජ' වර්ගයට අයත් ස්වර දෙකක් ලියා දක්වන්න.

ii. පහත සඳහන් පදවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් නිර්මාණය කරන්න.
(අ) මහන (ආ) මහණ

iii. පහත සඳහන් වාක්‍යයේ පද දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම පද දෙක පමණක් නිදොස් කොට ලියන්න.
ක්‍රීඩාංගනය කෙළවර සිටි අයගෙන් අතළොස්සක් දෙනා පමණක් ආපන ශාලාවට පැමිණ ආහාර ගත්හ.

iv. පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.
(අ) මහෙසුරු (ආ) සන්නස

v. වි ගොවිතැන හා බැඳුණු බස් වහරෙහි එන පහත සඳහන් පද සඳහා වන සාමාන්‍ය ව්‍යවහාර ලියා දක්වන්න.
(අ) වගා ඉස්සර (ආ) කයිබත

vi. පහත සඳහන් වාක්‍ය සදොස් ය. නිදොස් කර ලියන්න.
(අ) එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය රචකයෙකු ද විය.
(ආ) අපි සියලු දෙනා එක් ව පාඩම් කිරීම වටී.

vii. පහත සඳහන් යෙදුම් සඳහා සුදුසු තනි පද (ඡත්‍ර පද) ලියා දක්වන්න.
(අ) දියමන්තිවලින් නිම කරන ලද
(ආ) එකලා ව (තනි ව) හැසිරෙන

viii. පහත සඳහන් කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
(අ) වෛද්‍යවරුන් විසින් අසාධ්‍ය රෝගීහු පරීක්ෂා කෙරෙති
(ආ) දක්ෂ රියදුරෙකු විසින් නවීන බස් රථය පදවන ලදී.

ix. පහත පදවලට ගැළපෙන විරුද්ධාර්ථ පද ලියා දක්වන්න.
(අ) ආශිර්වාදය (ආ) කයෝර

x. කට පුරා පුතේ කියනා හඬ අන්න!
දරුවනේ උදේ වෙනකල් නාඩන්න
මට මගේ කඳුළු සීතල විඳ ගන්න
ඔබ එපා මවුනි ඇහැ පිසදාලන්න

ඉහත කවියෙහි ඇතුළත්
(අ) ආමන්ත්‍රණවාචි පදයක් (ආ) විධි ක්‍රියා පදයක් ලියා දක්වන්න. (ලකුණු 2×10=20)

2) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) 'පෙරදිග ධාන්‍යාගාරය' ලෙසින් නම් ලද ශ්‍රී ලංකාවේ මිනිසුන් ස්වාභාවික ආහාරපාන රටාවකට උරුමකම් කී අතර ලෙඩරෝග ආදියෙන් මිදීමටත්, සෞඛ්‍ය සම්පන්න ලෙස ජීවිතය පවත්වා ගැනීමටත් ප්‍රතිශක්තිකරණය ලබා ගැනීමටත් එම ආහාර ම උපයෝගී කර ගෙන ඇත. අද වන විට මේ තත්ත්වය සපුරා වෙනස් ය. වර්තමාන කුඩා දරුවාගේ පටන් වයසක පුද්ගලයා දක්වා ම ආහාරවල පාලනයක් දැකිය නො හැකි ය. ගුණයට වඩා දිව පිනවන රසයට බොහෝ දෙනා ගිජු වී ඇත. මේ තත්ත්වය වෙනස් විය යුතු ම ය.

(ආ) නිදහස් අධ්‍යාපනයේ අවස්ථා ලබා ගැනීම සහ එයින් තම ජීවිතය ජය ගැනීමට මෙරට උපන් සෑම දරුවෙකුගේ ම අයිතියකි. එයින් උපරිම ඵල නෙළා ගත් උදවියගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් රට හැර යාම ලක්මවට දැඩි දුකක් නොවන්නේ ද? රටේ ආර්ථික තත්ත්වයේ කඩා වැටීම පිළිබඳ විමසීමේ දී ඔවුන් මෙසේ රට හැර යාම සාධාරණ යැයි හැඟී ගිය ද ඔවුන් කළ යුත්තේ රට හැර යාම නො ව, ලක්මවට ආදරය කරන දරුවන් නම්, ඇය දුකින් මුදවා තමා ද සතුටින් සිටීමට හැකි වන පරිදි කටයුතු කිරීම බව හැඟේ.

(ඉ) 'හොඳ ම දේ දරුවන්ට යැ'යි පැවසුව ද ලෝක ළමා දින උත්සව ඉහළින් සැමරුව ද වර්තමානයේ ලංකාවේ දරුවන් අනාරක්ෂිත බව බොහෝ මාධ්‍යවලින් දැක ගත හැකි ය. පසුගිය දා සැමරූ ලෝක ළමා දිනයේ දී ද දරුවන් ලිංගික අතවරවලට ගොදුරු වූ බව ද දැනගන්නට ලැබිණි. දරුවන් නවීන තාක්ෂණික උපකරණවලින් ඈත් කිරීම, ඔවුන්ට නිසි රැකවරණය ලබා දීම, ඔවුන් විශ්වාස කිරීම හා පිළිගැනීම වැනි ක්‍රමවේද ඔස්සේ දරු සම්පත රැක ගත යුතු ය. මන්ද වර්තමාන දරු පරපුර රටේ ජීවනාලිය වන බැවිනි.

(ඊ) ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුළ වඩාත් ඔසවා තැබිය හැකි රාජ්‍යයකි. එහෙත් වර්තමාන තත්ත්වය එසේ නො වේ. විශේෂයෙන් ලංකාවට ආවේණික කර්මාන්ත රැසක් ඇත. ඒ කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු වන්නේ නම් රැකියා සම්පාදනය, විදේශ විනිමය ඉපැයීම, පරිසර සුරක්ෂිතතාව වැනි අංශ ගණනාවක් ම ජය ගත හැකි ය. දේශීය රෙදි පිළි නිෂ්පාදනය, ස්වාභාවික පරිසරයෙන් ලබා ගන්නා ද්‍රව්‍ය ආශ්‍රිත උපකරණ වන, වේවැල්, පොල් කටු, තල්පත් ආදී බොහෝ දේ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කර රට දියුණු කිරීමට කටයුතු කළ යුතු ය.

(ලකුණු 25)

3) පහත දැක්වෙන පාඨය වචන 55 – 65 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

පරිසරය සුරැකීම සඳහා ගත යුතු පියවර ඉතා පැහැදිලි ය. ඒ සඳහා ජනතාව දැනුම්වත් කිරීමත් නෛතික රාමුව ශක්තිමත් කිරීමත් අවශ්‍ය ය. එක් එක් රටවල් තනි තනි ව ගනු ලබන ක්‍රියාමාර්ගයක් මෙන් ම ලෝක ප්‍රජාව සාමූහික ව ගනු ලබන ක්‍රියාමාර්ගයක් ද එක සේ ම මේ සඳහා වැදගත් වනු ඇත. ස්වාභාවික සම්පත් තිරසාර ලෙස යොදා ගැනීම මෙන් ම, සංරක්ෂණය කිරීම, වනගහනය වර්ධනය කිරීම, ඒ සඳහා අලුතින් ගස් වැවීම, කාර්මික අපද්‍රව්‍ය පාලනය කිරීම හා කළමනාකරණය, පරිසර දූෂණය පාලනය කිරීම ජීවීන් රැක ගැනීම, වන ජීවීන් රැක ගැනීම, කාබනික පොහොර භාවිතය, රසායනික පොහොර භාවිතය හැකිතාක් දුරට අඩු කිරීම, ජනගහනය පාලනය කිරීම සහ පරිසරයට ආදරය කිරීමට හා පරිසරය සුරැකීමට ජනතාව විශේෂයෙන් ම තරුණ පිරිස් දැනුම්වත් කිරීම, ආදිය පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රමුඛතාව හිමිවිය යුතු කරුණු වශයෙන් පෙන්වාදිය හැකි ය. එක් අතකින් පරිසර විනාශය සහ පරිසරය සුරැකීම අතර අභියෝගයට මිනිසා මුහුණ දී සිටී. තවත් අතකින් ජනගහන වර්ධනය හා තිරසාර සංවර්ධනය අතර අභියෝගයකට මිනිසා මුහුණ දී සිටී. පරිසර මිත්‍රශීලී තිරසර සංවර්ධන උපාය මාර්ගයක් තුළින් ජනගහන වර්ධනය පාලනයකර ගනිමින් ආර්ථික සංවර්ධනයක් ලබා ගන්නේ කෙසේ ද යන්න වත්මන් ලෝකය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝගය යි. එම අභියෝගය ජය ගැනීම තුළින් පමණක් අපට පරිසර හානි වළක්වා ගත හැකි බව පැහැදිලි ව පෙනේ.

(ලකුණු 10)

4) පහත දැක්වෙන කොටස කියවා ඒ සමග ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.

සමාජයේ පැවැත්ම සඳහා යොමු කරනු ලබන මිනිස් කටයුතු බොහෝ ය. තනි ව කළ නොහැකි වැඩ බොහෝ වූ නිසා මිනිසා ආදියෙහි සිට ම සහයෝගයෙන් කටයුතු කිරීමට පුරුදු විය. එකෙකුට හෝ දෙදෙනෙකුට විශාල බරක් වැඩි දුරක් උසුලා ගෙන යැමට නුපුළුවන. එහෙත් කිහිප දෙනෙකු එකිනෙකාට අත්උදව් වෙමින් ක්‍රියා කළ හොත් එය ලෙහෙසියෙන් ම කළ හැකි ය. සරල ක්‍රම අනුගමනය කරමින් ගොවිතැන් කළ ආදි යුගයේ දී පවා මිනිසාට අන්‍යෝන්‍ය සහායත්වය අවශ්‍ය විය. කෘෂිකර්මයේ ව්‍යාප්තියත් සමග ම ඊට සම්බන්ධ කාර්යයන් රාශියක් පැන නැංගේ ය. ඒ ඒ කාර්යය සඳහා අවශ්‍ය විශේෂ දක්ෂතා ද ඒ දක්ෂතා ප්‍රගුණ කොටගත් පිරිස් ද අවශ්‍ය වූ බව පෙනේ. මෙහි දී ඇතැම් පිරිසක් යම් යම් වැඩක නිපුණතාවකුත් තවත් පිරිසක් වෙන විදියක කාර්යයක නිපුණතාවකුත් ලබන්නට යොමු වූහ. දක්ෂතා අතර වෙනස්කම් ඇති විවිධ වෘත්තීන් බිහි වූයේ මේ අන්දමට ය. මේ ආකාරය කොතරම් දුරට පුළුල් වී තිබේ ද යත් අද කමිසයක බොත්තමක් ඇල්ලීම වැනි කටයුත්තක් පවා එහි ලා විශේෂ පුහුණුවක් ලත් අයෙකුගේ කාර්යයක් බවට පත් වී ඇත. ශ්‍රම විභජනය හෙවත් රැකීරක්ෂා බෙදී යැමට මහ පැදෙන්නට ඇත්තේ මේ අන්දමට ය.

i. මේ පාඨයෙන් ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන ප්‍රධාන අදහස කුමක් ද?
ii. ආදි මිනිසා සාමූහික ව කටයුතු කරන්නට පෙළඹුනේ ඇයි?
iii. "ලොවින් එකෙක් එක් දෙයකට වෙයි සමත" යන පැරණි කියමනේ සාමාන්‍ය අදහස, මේ පාඨයෙන් ලබා ගෙන එය වාක්‍යයකින් ලියන්න.
iv. "කමිසයක බොත්තමක් ඇල්ලීම" යන නිදර්ශනය දක්වා ඇත්තේ කවර අදහසක් කියා පෑමට ද?
v. අර්ථ දක්වන්න.
(අ) විභජනය (ආ) නිපුණතාව

(ලකුණු 2×5=10 යි)

5) ඔබේ විද්‍යාලයේ පැවැත්වීමට නියමිත වර්ෂ අවසාන විවිධ ප්‍රසංගය සඳහා න්‍යාය පත්‍රයක් පිළියෙල කරන්න.

- දිනය
- විවිධ ප්‍රසංගය සඳහා සුදුසු නමක්
- විවිධ අංග ඉදිරිපත් කිරීම කවුරුන් විසින් ද?
- ඒ ඒ කාර්යට නියමිත වේලාව කොපමණ ද?

ආදි තොරතුරු ඇතුළත් කරන්න.

නැතහොත්,

වෛද්‍ය නිර්දේශයකින් හෝ රෝග පරීක්ෂාවකින් තොර ව ඔසුහල්වලින් ඖෂධ ලබා ගැනීමේ අවස්ථා වැඩි බවක් දැන් දැන් පෙනෙන්නට ඇත. මෙහි ඇති භයානක පැති රැසකි.

- හිතුමතේ ඖෂධ ලබා ගැනීම වෙනත් සංකූලතාවන් ඇති වීමට හේතු විය හැකි බව.
- රෝගියා මරණයට පවා පත් විය හැකි බව.

නීති විරෝධී කටයුත්තක් සිදු කළ හොත් ලබා දෙන දඬුවම්, පනවන නීති රීති ද මෙවැනි අවස්ථාවන් පිළිබඳ තොරතුරු ඇත්නම් දන්වන ලෙස ද ඉල්ලමින් සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. ඔබ ඖෂධ නියාමන අධිකාරියේ සභාපති සේමින්ද නානායක්කාර බව සිතන්න.

(ලකුණු 15 යි)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

32864

| ශ්‍රේණිය தரம் Grade | 10 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය - III | කාලය நேரம் Time | පැය 2 යි |
|---|---|---|---|---|

නම பெயர் Name ...................................... විභාග අංකය சுட்டிலக்கம் Index No. ......................

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.

---

**1.** (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. (අ) ජාතක කතා ඇසුරෙන් රචිත ගී කාව්‍ය දෙකක් නම් කරන්න.
(ආ) ජාතක කථාවක දක්නට ලැබෙන අංග මොනවා ද?

II. (අ) ඇස්. මහින්ද හිමියන් විසින් රචිත ජාතිකාභිමානී කෘති දෙකක් නම් කරන්න.
(ආ) එස් මහින්ද හිමියන් විසින් රචිත මුල් ම කාව්‍ය කෘතිය නම් කරන්න.

III. (අ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත නවකතාවක් නම් කරන්න.
(ආ) එතුමා විසින් රචිත ස්වයං ලිඛිත චරිතාපදානයේ නම ලියන්න.

IV. ඉතිරි කවි පද සම්පූර්ණ කරන්න.
තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
(අ) ......................................
(ආ) ......................................

V. (අ) 'ගංගාවේ සංගීතය' පද්‍ය පන්තිය රචනා කළේ කවුද?
(ආ) මෙම රචකයා අයත් වන යුගය නම් කරන්න.

VI. "ගොස් සෙදින මම සොයනෙමි වනපෙත"
(අ) මෙසේ පවසන්නේ කවුද ?
(ආ) සොයන්නේ කවුරුන් ද?

VII. "මොන වැරැද්දට ද හිරේ වැටුණෙ ? "
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුද?
(ආ) මෙය ශ්‍රවණය කළේ කවුද?

VIII. දෙදෙන ම ඉද දෙ පිට
සව් සත සතන් තුටු කොට
සුර ගඳඹුන් ලෙසට
පටන් ගෙන වෙණ ගායනාවට

(අ) ඉහත සඳහන් කවිය ඇතුළත් කෘතියේ රචකයා නම් කරන්න.
(ආ) ඉහත සඳහන් කවියේ ඇතුළත් උපමාවක් ලියන්න.

IX. ගසට කෙටුම ගස මුල පෑයුමෙන් දැනේ
මිනිහා නොමිනිහා යන **කඩිසරෙන්** දැනේ
අමුතු බත් දිම අත ඇල්ලුමෙන් දැනේ
හාතා භීය පාතා **අඬහැරෙන්** දැනේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න
(ආ) මෙම කවිය අයත් ජනකවි ගණය කුමක් ද?

X. "මේ සා මහත් වූ තොපගේ උපායෙකින් වැඩකුත් නිමාවකුත් දුටු දෑ නැති."

(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද?
(ආ) මේ ප්‍රකාශය ශ්‍රවණය කළේ කවුරුන් ද? (ලකුණු 2×10=20)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
නුඹයි මගේ පුතා උතුම්

(අ) කවියේ දැක්වෙන උතුම් ගුණාංග මොනවා ද ?
(ආ) කවියේ අර්ථය ලියන්න.

ii. සිනිඳු වස්ත්‍ර මිණි අබරණ
**තුමුල මාලිගා**
සුවඳ බොජුන් සැප සයනා
**මිරිවැඩි සඟළා**
මේ සියල්ල හැරදා මම
ආවෙමි වලටා

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

iii. කඳු බෑවුමක දං බෝවිටි පඳුරු තළා
පහළට ඇදී පර මල් පෙති ඉවත නොළා
**කලදෝ දියෙන් පොහවා රන් පුලින තලා**
සංගීතවත් වී යමි ඉදිරියට ගලා

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාඨයේ අදහස ලියන්න.
(ආ) ගංගාව ඉදිරියට ගලා යන ආකාරය කවියා ඉදිරිපත් කරන්නේ කෙසේ දැයි කෙටියෙන් දක්වන්න.

iv. "ජඩය, මැත නොදොඩා තොයිත් තාගේ පණ නො නසා යන අතෙක නැඟී යා " යි යනාදින් කිය-කියා ඔහුගේ බස් තමන් කනෙක නො හෙළා ඕ හට ආක්‍රෝශ පරිභව බෙණෙමින් නො රඳා ම දිවන්නාහ.

(අ) පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.
(ආ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

v. පිය සන් නො ව බිඟු දැල් රැඳි කොපුලී
අවසන් නො ව වෙණ නදට ම කුහුලී
මද සන්සුන් පියොවින් සිටි නොසැලී
ගජ සෙන් සිතියම් ගජ සිරි කියෙලී

(අ) මෙහි සඳහන් ආකාරයට ඇතුන්ගේ හැසිරීම වෙනස් වූයේ ඇයි ?
(ආ) මෙම කවියේ අන්තර්ගත කාව්‍යාලංකාර දෙකක් ලියන්න. (ලකුණු 4×5=20)

3. 
- වචන විනාශකාරී ලෙස භාවිතයෙන් සමාජයට වන හානියත්
- උපායශීලී ව ඒවා ජය ගත හැකි ආකාරයත්

උම්මග්ග ජාතකයෙන් මැනවින් නිරූපණය වේ. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

<u>නැතහොත්</u>

- අවස්ථාවට ගැළපෙන ලෙස චරිත වෙනස් කිරීමත්
- උචිත කාව්‍යෝපක්‍රම භාවිත කිරීමත්

නිසා ගුත්තිල කාව්‍යය වඩාත් රසවත් වී ඇත. නිර්දිෂ්ට කොටස ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15)

4. 
- පුද්ගල චරිත සංවර්ධනයත්
- ජාතිකාභිමානය ජනිත කරවීමත්

'මුනි සිරිපා සිඹිමින්නෝ' පද්‍ය පන්තියෙන් අපේක්ෂිත ය. නිර්දිෂ්ට කොටස ඇසුරින් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

<u>නැතහොත්</u>

නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින්

- සිංහබාහුගේ චරිතයත්
- සිංහසීවලීගේ චරිතයත්

සිංහබාහු නාට්‍යයේ නිරූපණය කර ඇති ආකාරය විමසන්න.

(ලකුණු 15)

5. 'ගංගාවේ සංගීතය' පැදිපෙළ රචනයේ දී කවියා භාවිත කාව්‍යෝපක්‍රම පැදිපෙළ රසවත් කිරීමට හේතු වී ඇත. උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

(ලකුණු 10)

6. ක්‍රමයෙන් අභාවයට යන ගමක ස්වභාවය බැද්දේගම නවකතාවෙන් මැනවින් නිරූපිත ය. නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

(ලකුණු 10)

7. මනා සංයමයෙන් යුතු ව උදාහරණ දක්වමින් උපදෙස් දෙන්නට ජන කවියා තුළ වූ අපූර්ව හැකියාව 'භානා හිය පානා අඩහැරෙන් දැනේ' පැදි පෙළෙන් මැනවින් නිරූපිත ය. උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

(ලකුණු 10)

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**තෙවන වාර පරීක්ෂණය - 2023**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

**10 ශ්‍රේණිය 1,11**

**පිළිතුරු පත්‍රය**

I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01. 1 | 11. 3 | 21. 2 | 31. 2 |
| 02. 3 | 12. 4 | 22. 3 | 32. 3 |
| 03. 2 | 13. 3 | 23. 1 | 33. 1 |
| 04. 1 | 14. 1 | 24. 3 | 34. 4 |
| 05. 4 | 15. 4 | 25. 4 | 35. 3 |
| 06. 2 | 16. 2 | 26. 1 | 36. 3 |
| 07. 1 | 17. 3 | 27. 2 | 37. 1 |
| 08. 4 | 18. 1 | 28. 3 | 38. 3 |
| 09. 2 | 19. 4 | 29. 4 | 39. 2 |
| 10. 1 | 20. 4 | 30. 4 | 40. 2 |

II පත්‍රය - පිළිතුරු

01.

i (අ) - අ,ආ
(ආ) - උ,ඌ

ii (අ) - මැසීම (යන අර්ථය)
(ආ) - මහණ (ශ්‍රමණ,භික්ෂු යන අර්ථය)

iii
- ක්‍රීඩාංගණය
- ආපණ ශාලාව

iv (අ) - මහ + ඉසුරු (ස්වරාදේශ සන්ධිය)
(ආ) - සන් + හස (පූර්වරූප සන්ධිය)

v (අ) - කුඹුර,කෙත,වෙල
(ආ) - කුඹුරේ දී ගන්නා ආහාර

vi (අ) - ලේඛකයෙක්
(ආ) - අප

vii (අ) - වජ්‍රමය/විදුරුමුවා
(ආ) - ඒකවාරී/එකසර

viii (අ) - වෛද්‍යවරු අසාධ්‍ය රෝගීන් පරීක්ෂා කරති.
(ආ) - දක්ෂ රියදුරෙක් නවීන බස් රථය පැදවී ය./පැදවූයේ ය.

ix (අ) - ශාපය
(ආ) - මධුර

x (අ) - පුතේ,දරුවනේ,මවුනි.
(ආ) - නාඩන්න,විඳගන්න,පිසදා ලන්න.

(2 × 10 – 20)

02. රචනය
ලකුණු විග්‍රහය - ලකුණු 25

1. සාරවත් භාවය,මාතෘකාව ද ඇතුළු ව ලකුණු 08 යි.
2. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ලකුණු 12 යි.
3. ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම ලකුණු 05 යි.

03. සාරාංශය
ලකුණු විග්‍රහය

1. අන්තර්ගතය ලකුණු 06 යි.
2. වචන ගණන ලකුණු 02 යි.
3. ශිල්පීය දක්ෂතා ලකුණු 02 යි.

04.

i. සාමූහිකත්වය/සාමූහිකත්වයේ අගය/එකමුතු බව.
ii. තනිවම කළ නොහැකි වැඩ බොහෝ වූ නිසා.
iii. එකිනෙකාට විශේෂ වූ දක්ෂතා ඇත.
iv. ඉතා සුළු වැඩකට වුවද ප්‍රගුණ කළ යුතු විශේෂ දක්ෂතා ඇති බව ප්‍රකාශ කිරීම.
v. (අ) - විභාජනය - බෙදී යෑම /බෙදීම.
(ආ) - පුහුණුව තුළින් ලබන හැකියාව /පළපුරුද්ද නිසා ඇති වන ශූර බව/හැකියාව විශේෂඥභාවය / විශේෂ ප්‍රාගුණ්‍යය.

05. න්‍යාය පත්‍රය හා අත් පත්‍රිකාව ලකුණු විග්‍රහය

1. ආකෘතිය ලකුණු 04 යි.
2. අන්තර්ගතය ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න